# ඇවිත් නොරටක

ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික පවුලක කතාවක්

කොටස් වශයෙන් පලවන නවකතාව....

## 27

පසුගිය කළාපයෙන්....

''අප්පච්චිටත් හරි සතුටුයි දැන් මුණුබුරයි මිණිබිරියි දෙන්නම විශ්ව විද්‍යාලෙට යනවනෙ. මායි අප්පච්චියි දෙන්නම ගියා මේ ළමයට කතා කරන්න. කෝ පත්තරේ රිසල්ට්ස් බැලුව විතරයි ඔන්න ටෙලිෆෝන් එකේ එල්ලිලා''

නිර්මලීගේ හඬේ වෙනදා ඇති අමනාපය අද නැති ලෙසකි සුනිමල්ට හැඟුනේ, විභාග ප්‍රතිඵල පිළිබඳව දෙමාපියන් හා සීයා සමග කතාබස් කර සතුට බෙදාගත් අවන්ති ලහි ලහියේ ලැහැස්ති වූයේ ජේසන් හමුවීමට ය. නෝර්ත් සිඩ්නි ප්‍රදේශයේ අවන් හලකදී හමුවීමටය ඔවුන් දෙදෙනා දුකථනයෙන් කතිකා කර ගත්තේ.

''දුව කොහේද මේ යන්නේ අද සන්තෝස දවසෙ ගෙදර ඉන්න එපායැ'' කොට සායක් ඇඳ, ළැම පෙදෙස අඩක් පෙනෙන සේ හැඳගත් කොට හැට්ටය ඔසවමින් රතුවන් තොල් ආලේපයක් තොලේ දවටන අවන්ති දෙස බලමින් පලිපාන ඇසුවේ ය.

කාමරය දෙවනත් කරන තරම් උස් හඬින් නගින සංගීත රාවය නිසා පලිපාන කියූ දේ අවන්තිට නොඇසිණ.

පලිපාන කාමරයේ සිට සවන් දෙමින් සිටියේ එස්.බී.එස්. ගුවන් විදුලියේ සිංහල වැඩ සටහනකට ය. සෑම ඉරිදාම මධ්‍යාහ්න දොලහේ සිට පැයක් තිස්සේ විසුරුවා හරින සිංහල ගුවන් විදුලි වැඩ සටහනට සවන් දීමට ඔහු කිසි විටෙක අමතක කළේ නැත. සෑම ඉරිදාම ඒ පැය තුළ ඔහු ශ්‍රී ලංකාවේ ජීවත් වන බවකි ඔහුට හැඟී ගියේ, සතියේ ශ්‍රී ලංකාවේ දේශපාලන පුවත් වලින් පසුව ලංකාවේ මාධ්‍යවේයෙකු ඉදිරිපත් කරන ප්‍රවෘත්ති සමාලෝචනය කාලීන දේශපාලන, සමාජ, කලා හා සංස්කෘතික තොරතුරු වලින් සමන්විත ය. සිඩ්නි නුවර පැවැත්වෙන විවිධ ප්‍රජා උත්සව පිළිබඳව ඔහු දැන ගත්තේ එස් බී එස් ගුවන් විදුලියේ ප්‍රජා පුවත් වලට සවන් දීමෙනි. ඉඳ හිට ඉදිරිපත් කරන ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන දේශපාලඥයන් හා කලාකරුවන් සමග පවත්වන සම්මුඛ සාකච්ඡා වලටද පලිපාන සවන් දුන්නේ මහත් ආසාවකිනි.

මෙදින ඔහු සවන් දෙමින් සිටියේ ශ්‍රී ලංකාවේ සිට ඉදිරිපත් කරන කාලීන ප්‍රවෘත්ති සමාලෝචනයෙන් පසුව විසුරුවා හරින ලද 'මව් දිනය' නිමිත්තෙන් සකස් කළ විශේෂ වැඩ සටහනකට ය. මෙල්බර්න් නුවර සිට වෛද්‍යවරියක විසින් සිංහලෙන්ද පසුව ඉංග්‍රීසියෙන්ද ඉදිරිපත් කළ කෙටි දේශනය දෙමාපියනට දූ දරුවන් විසින් සැලකීමේ වැදගත් කම කදිමට කියා පාන දෙසුමක් ලෙසය පලිපාන සිතුවේ. මවට උපහාර දැක්වීම සඳහා එක් දිනක් පමණක් වෙන් කර ඇත්තේ කුමක් නිසාදැයි සිතන පලිපානගේ සිත නොසන්සුන් වෙයි. දෙමාපියන් සිහි කිරීමට, සැලකීමට, ඔවුනට උපහාර දැක්වීමට එක් දිනක් පමණක් වෙන් කිරීමෙන් පලක් වේද ? දූ දරුවන් විසින් හැමදාම එක ලෙස දෙමව්පියන් රැක බලා ගත යුතු ය. එදින සන්ධ්‍යාවේ අවන්ති හා ප්‍රසංග විසින් නිර්මලීට ගෙනැත් දුන් විශාල රෝසමල් පොකුර මැද සාලයේ මේසය මත වීදුරු බඳුන් දෙකක දමා තිබෙනු පලිපාන දුටුවේ ය. රෝස මල් පෙකුරු එතූ රිදී පැහැති දිලිසෙන දවටනයේ අලවා ඇති කුඩා සුදු පාට ස්ටිකරයට දෑස ලංකර බැලූ පලිපාන ඒ මල් පොකුරේ වටිනාකම ඩොලර් විසිපහක් බව දුටුවේ ය.

ඒ අසලින් ම මව් දිනය වෙනුවෙන් විශේෂයෙන් සකස් කළ 'මදරස් ඩේ' කාඩ් පතක්ද තබා තිබිණ. ඕස්ට්‍රේලියාව වැනි බටහිර සංස්කෘතිය වැළඳගත් ජීවන රටාවක් ඇති සමාජයක කාර්ය බහුල දූ දරුවන්ට තම දෙමාපියන් සිහි කිරීම සඳහා එක් දිනක් වත් වෙන්කර තැබීම වැදගත් බව දහවල් එස් බී එස් ගුවන් විදුලියෙන් කතා කළ ශ්‍රී ලාංකික වෛද්‍යවරිය කියූ සැටි පලිපානට සිහිවිය. මව් දිනය, පිය දිනය වැනි උත්සව දින පැරණි සංස්කෘතික හා ඓතිහාසික වැදගත් කමක් ඇති දින රහිත ඇමරිකානු සමාජය විසින් සකස් කරගෙන ඇත්තේ වාණිජ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම පිණිස යයි පලිපානට සිතිණි.

''හැපි මදර්ස් ඩේ'' කියමින් අවන්ති නිර්මලී සිප වැළඳ ගන්නා සැටි පලිපාන බලා සිටියේය. තමන් මෙරට පැමිණි දිනවල ම දණ ගසා දෙමාපියනට වැඳීමට අවන්ති හා ප්‍රසංග පුරුදු කළ සැටි පලිපාන සිහි කළේ ය. ඒ පුරුද්ද පැවතුනේ මාස කිහිපයක් පමණි.

මවු දිනයේත් ප්‍රසංග හා අවන්ති සන්ධ්‍යා භාගයේ ගෙදරින් පිටවී යන සැටි බලා සිටි පලිපානට ඇති වූයේ කණස්සල්ලකි.

''මදර්ස් ඩේ එකේ වත් මේ දෙන්නට අම්මට සලකල ගෙදර ඉන්න බෑනේ'' යි සාලයේ සිටි සුනිමල් කීවේ ය.

''ඒක තමයි මමත් කල්පනා කළේ''යි කාමරයෙන් එළියට එමින් පලිපාන කීවේ ය.

''මේ දරුවො දෙන්න කිසිම ඇඟෑලි කමක් නැහැ ගෙදරට, අනේ මම දන්නෙ නැහැ''

''අපේ කරුමෙ තමයි අප්පච්චි'' නිර්මලී ශෝකී ස්වරයෙන් කීවා ය. ''මේ රටවල් වලට ආපු එකේ වැරැද්ද ඕක තමයි''

සුනිමල් නිහඬව සිටියේ ය. ඉරිදාවක් වූ එදින ඔහුත් පාන්දරින් ම රෝස මල් කිණිති කීපයක් ගෙනැත් නිර්මලීට දී මව් දිනය නිමිත්තෙන් සුභ පැතුවේ ය. හෙට පාන්දරින්ම නැගිට කාර්යාලයේ කිසියම් කටයුත්තක් සඳහා කැන්බරා නුවරට යා යුතුය. පැය තුනක පමණ වාහනයෙන් යන ඒ ගමනට සූදානම් වූ සුනිමල් දහවල් ආහාරයෙන් පසු පැය දෙකක් පමණ නිදා ගත්තේ ය.

දෙසතියකට වරක් සිංහල කඩයට යන පලිපාන ගේට්ටුව අසලට වී බලා සිටියේ සමරවික්‍රම වාහනයෙන් පැමිණෙන තෙක් ය. දහවල් එකොලහට පමණ තම පරණ ෆෝඩ් රථය පදවාගන එන සමරවික්‍රම පලිපානද රථයේ නංවාගෙන පෙනන්ට් හිල්ස් උපනග රයේ ඇති 'ඔස් ලංකා' වෙළඳ හලට යයි. මෙදින මඳක් ප්‍රමාද වී පැමිණි සමරවික්‍රම පලිපාන නංවාගෙන ටික දුරක් වාහනය පදවාගෙන ගොස් කියූ පුවතින් පලිපාන දැඩි කම්පනයට පත්වූයේ ය. ඔවුන් දෙදෙනාගේ ම මිතුරෙකු වූ විජේතිලකගේ බිරිඳ මිය ගිය පුවත සමරවික්‍රම පවා සැලකර සිටියේ බිඳුණු හඬිනි. කුඩා දැරියක මෙන් සන්සුන් හඬින් කතාබස් කළ විජේතිලක මැතිණිය කිහිප විටක් ලංකාරාමයේ සිල් සමාදන් වීමට ගිය අවස්ථාවලදී තමා සමග සුහද ලීලාවෙන් කතාබස් කළ හැටි පලිපානට සිහිපත් විය. වැඩිහිටි සමාජයේ පිරිසක් මීට වසරකට පමණ පෙර සිඩ්නි නගර සිරි නැරඹීමට ගිය විනෝද චාරිකාවට ද ඇය සහභාගි වූ බව පලිපානට මතක ය. දෙසතියක සිටම ඇය වකුගඩු ක්‍රියා විරහිත වීම නිසා රෝහල් ගතව සිටි බව පලිපාන දනී. ප්‍රවාහන පහසුකම් නොතිබුණු නිසාය පලිපානට රෝහල් ගතව සිටි ඇයව බැලීමට නොහැකි වූයේ, ඒ බව සිහි කළ පලිපාන වඩාත් ශෝක වූයේ ය.

''අනේ හොඳ අම්මණ්ඩි මිස්ට විජේතිලකට තමයි දැන් පාඩුව''

''මට හරි කණගාටුයි මැරෙන්න කලින් ඉස්පිරිතාලෙට යන්න බැරි වුනානේ'' පලිපාන කණගාටු වූයේ ය.

''අපිටත් ඉතිං තව ටික දවසකින් ඔය ඉරණම තමයි. කවුද දන්නේ ?''

''දැන් මරණෙ වැඩ කටයුතු කොහොමද ? මිස්ට සමරවික්‍රම යනකොට මමත් එක්කරගෙන යන්න''

''මට ආරංචි හැටියට ඊයෙ රාත්තිරියෙ නැතිවෙලා තියෙන්නේ''යි සමරවික්‍රම කීවේ ය.

''මිනිය බලන්න තියෙන්නෙ හෙට හැන්දෑවෙ තුනේ ඉඳන් හය වෙනකං, අනිද්දා ආදාහනේ''

''ඇයි ගෙදරට ගිහින් මිනිය බලන්න බැරිද ?''

''මෙහෙ ඒව බැහැනෙ මිස්ට පලිපාන'' සමරවික්‍රම කීවේ ය. ''ෆියුනරල් පාලර් එකේ තමයි ඉතිං බලන්න වෙන්නේ, ඊට පස්සෙ සීත කාමරේ දාල තියෙනවා. කවුන්සිල් එකෙන් විශේෂ අවසරයක් නැතිව ගෙදරට ගේන්න දෙන්නේ නැහැ''

සමරවික්‍රම කියූ දේ අසා පලිපාන මවිත විය. මිය ගිය තැනැත්තෙකුට අවසාන ගෞරවය දැක්වීමට පවා මෙරට දමා ඇති තහංචි කොතරම් අමානුෂිකද ? මියගිය තැනැත්තා ජීවත්වූ නිවසට ඔහුගේ මල සිරුර ගෙන ඒමට පවා අවසර ගත යුත්තේ කුමක් නිසා ද ?''

පසුදින සන්ධ්‍යාවේ විජේතිලක මැතිණියගේ දේහයට අවසන් ගෞරව දැක්වීමට පලිපාන ගියේ සමරවික්‍ර සමගය. ''ඇලන් ඩෙව්ලින්'' මෘතදේහ ප්‍රදර්ශණාගාරය පසුපස රථ ගාල වෙත සමරවික්‍රම රථය හරවන විට පස්වරු තුන පසු වුනා පමණ ය. එහි ප්‍රධාන ගොඩනැගිල්ලේ දොරටුව අසල කළු සූට්වලින් සැරසුණු කිහිප දෙකනු සිටින බව වාහනයෙන් බහින පලිපාන දුටුවේ ය.සමරවික්‍රමත් සමග ශාලාවට ඈාතුළු වුණු පලිපාන දොර අසල උස් බංකුවක තිබූ විශාල ලොග් පොතේ තම නම සටහන් කර ශාලාවට ඇතුළු විය. දෙපසින් පුටු තබා චාම් අන්දමින් සකස්කර තිබූ ශාලාවේ ඉදිරි කොළවර රිදී පැහැති ආධාරකයක් මත දුඹුරු පැහැයෙන් දිලිසෙන මිනී පෙට්ටිය තැන්පත් කර තිබිණි. පලිපාන සමරවික්‍රම සමග දේහය අසලට ගොස් දුක්බර මුහුණෙන් විජේතිලක මැතිණියගේ සිරුර දෙස බලා සිටියේ ය. දෑස් තදින් පියාගෙන ලය මත තබාගත් දෑතින් යුතු දේහය බොහෝ සේ කලු පැහැයට හැරී ඇති සැටියකි පලිපානට පෙනුනේ, දේහයට ආචාර කර ඔවුහ් දෙදෙනාම අසල තබා තිබූ පුටුවක හිඳ සිටි විජේතිලක මහතාට අතට අත දී ශෝකය පළ කර ශාලාවේ වාඩි වූහ. මඳ වේලාවකින් ම ශාලාව පිරී යන සැටි පලිපාන දුටුවේ ය. කාර්යාලයේ සිට එන ගමන් සුනිමල් හා නිර්මලීද දේහයට අවසන් ගෞරව දැක්වීමට පැමිණි සැටි පලිපානගේ නෙත ගැටිණි. තමන් සමග ගෙදර යාමට හැකි බව නිර්මලී තම පියාට කීවත් පලිපාන ඒ ඉල්ලීම ප්‍රත්ක්ෂේප කළේ සමරවික්‍රම සමග ගෙදර ආ හැකි බව කියමිනි. මඳ වේලාවකින් නැගිට සමරවික්‍රමත් සමග ශාලාවෙන් පිටතට ගිය පලිපාන අවසන් ගෞරව දැක්වීම සඳහා පැමිණ සිට වැඩිහිටි හිතවතුන් කිහිප දෙනෙකු සමග කතාබස් කරමින් සිටියේ ය. සවස හය පසුවුණ විගසම මෘත දේහය ප්‍රදර්ශණාගාරයේ අධ්‍යක්ෂ සුදු ජාතිකයා පැමිණ පෙට්ටිය වසන්ට ආසන්න බව කීවේ ය. විජේතිලක මහතාත්, ඇඬූ කඳුලෙන් සිටි ඔහුගේ දියණිය හා බෑණන් දේහය අසලට ගොස් දේහයට වැඳ ආචාර කරමින් මඳ වේලාවක් ගත කළ පසු පෙට්ටිය වසා ශාලාව පිටුපස වූ ශීත කාරමය වෙත ගෙන යන සැටි පලිපාන බලා සිටියේ දැඩි කම්පනයකිනි. සමරවික්‍රම සමග වාහනයෙන් එන අතරේ දී ද ඔහු කතා කළේ මේ පිළිබඳවය.

''මට නං හිතා ගන්න අමාරුයි මිස්ට සමරවික්‍රම මේ වගේ දේවල්'' පලිපාන කටහඬ අවදි කළේ ය. ''අපේ රටේ මිනිය වලළනකන් තනි කරන්නෙ නැහැනේ. රෑ එළිවෙනකන් උනත් කවුරු හරි ළඟ ඉන්නවනේ. මිනිය අර හීතල කාමරේ දාල තනි කරහම මිස්ට විජේතිලකට මොන තරම් වේදනාවක් ඇද්ද හිතේ ?''

''මේ රටේ ගොඩක් හොඳ දේවල් තියෙනව අපට ඉගෙන ගන්න''යි විදුලි සංඥා රතු එළිය අසල වාහනය නතර කළ සමරවික්‍රම කීවේ ය. ''තමන්ගෙ කෙනෙක් නැති උනාම පැයක් දෙකක් විතරක් මිනිය බලන්න දීල සීත කාමරේට දාලා වහල දාන එකේ තේරුම මටත් හිතාගන්න අමාරුයි''

මේ සමාජය මිනිසුන්ගේ කායික සුබවිහරණය සඳහා පමණක් අමුද්‍රව්‍ය සපයන භෞතික සමාජයක්ය යන විටින් විට තමන් තුළ ඇති වුණු හැඟීම මෙවන් සිදුවීම් තුළින් තව දුරටත් සනාථ වන බවකි පලිපානට හැඟුනේ, ආධ්‍යාත්මික සුවය විඳ ගැනීමට අනුබල දෙන පරිසරයක් මේ සමාජය තුළ හැඩ ගසා ගෙන ඇත්තේ විවිධ රටවලින් පැමිණ මෙරට ජීවත් වන නොයෙක් සංස්කෘතික හා ආගමික පසුබිමකින් යුත් ජනකාය විසින් යයි පලිපාන හිතුවේය. සතියකට පෙර ඔහු ප්‍රාදේශීය පුස්තකාලයෙන් ගත් පොතක වූ කියමනක් ඔහුට සිහිපත් විය. පිලිප් නයිට්ලි නම් වූ ලේඛකයා ලියා තිබුණ එම ඉංග්‍රීසි පොතේ නම ''ඕස්ට්‍රේලියානු ජාතියේ චරිත කතාව'' නම් විය.

ලබන කලාපයට.....



පාලිත ගනේවත්ත
සිඩ්නි